# ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය

ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය

## ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ පුරප්පාඩු වී ඇති ගණකාධිකාරී තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

### ගණකාධිකාරී තනතුර - 01

**පත්වීමේ ස්වභාවය**

ස්ථිර තනතුරකි, සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායකත්වය හිමිවේ.

**වැටුප් පරිමාණය :**

MM 1-1 2016 රු. 53,175 - 10x1375 - 15x1910 - රු. 95,575.00

**අධ්‍යාපන සුදුසුකම් :**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍ය කළමනාකරණ හෝ ගිණුම්කරණය පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම.

හෝ

(ආ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ / එක්සත් රාජධානියේ සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනයේ අන්තර් මාධ්‍ය පරීක්ෂණය සමත්වීම.

සහ

ඉහත (අ) හෝ (ආ) සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු එම සුදුසුකම බඳවා ගැනීමේ අවම සුදුසුකම් ලෙස සලකන ලද තනතුරක මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 01 ක පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම :**

ආයතනයේ කනිෂ්ඨ කළමනාකරණ සේවා ශ්‍රේණියේ (JM) ගිණුම් නිලධාරී තනතුරෙහි වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**කාර්යයන් :**

- ආයතනයට අවශ්‍ය ප්‍රතිපාදන ලබාගැනීම හා මූල්‍ය කළමනාකරණය
- ආයතනයේ මුදල් කටයුතු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල් සමගින් ආයතනයට වගකීම
- මූල්‍ය පරිපාලනයට නීති රීති හා රෙගුලාසි සකස් කිරීම
- අයවැය සහ අවසාන ගිණුම් අධීක්ෂණය හා සම්බන්ධීකරණය
- ආයතනයේ ටෙන්ඩර් මණ්ඩලය ඇතුළුව ගබඩා කටයුතු අධීක්ෂණය
- ගිණුම් අංශයේ නිලධාරීන් ගිණුම් කටයුතු නිවැරදිව කරන බවට වග බලා ගැනීම
- පත්වීම් බලධරයා විසින් පවරනු ලබන තනතුරට අදාළ වෙනත් කාර්යයන්

**බඳවාගැනීමේ ක්‍රමය :**

පත්වීම් බලධරයා විසින් නියම කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

**වයස :**

අවුරුදු 22 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතුය.

**අයදුම්පත් එවිය යුතු පිළිවෙළ :**

ජීවදත්ත විස්තර ඇතුළත් අයදුම්පත්‍රය අධ්‍යාපන වෘත්තීය සහතික හා ඥාතීන්වයක් නොමැති දෙදෙනකුගේ නම් දුරකථන අංක සහ ලිපිනයන් සමග 2017 මැයි මස 25 වන දිනට පෙර පහත සඳහන් ලිපිනය වෙත එවිය යුතුය. ඉල්ලුම් කරන තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කොටසේ සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය,**
**අංක 40, බුත්ගමුව පාර, රාජගිරිය.**

**දු.ක. 011-3092910 / 0113-092904**